## අන්තර්ජාලය නිසි / අනිසි ලෙස භාවිතා කිරීමට අදාළ HateFreeCP එක් දින පාසල් වැඩසටහන

**1.** වැඩසටහනේ අරමුණු

**1.1.** පාසල් සිසුන් අන්තර්ජාල භාවිතයේදී අනිසි ප්‍රයෝජන වලට යොමුවීම වැළකීම.

**1.2.** අන්තර්ජාලයෙන් ඔවුන්ට සිසුන් වශයෙන් ගත හැකි ප්‍රයෝජන පෙන්වාදීම.

**1.3.** සිසුන් අන්තර්ජාල භාවිතයේදී අනිසි භාවිතා වලින් මුදවා ගෙන නිසි භාවිතයට යොමු කිරීම සඳහා ගුරු භවතුන් හා දෙමව්පියන්ට අවශ්‍ය තොරතුරු සපයා දීම.

**1.4.** අන්තර්ජාලය අනිසි ලෙස භාවිතයෙන් විපතට පත්වන ළමුන් එයින් මුදවා ගැනීමට ගත හැකි පියවර පෙන්වා දීම.

**2.** පාසල් ළමුන්, ගුරු භවතුන් හා දෙමව්පියන් සඳහා මෙම මොඩියුලය භාවිතා කළ හැක.

**2.1.** පාසල් ළමුන් (අවුරුදු 10 සිට 16) සඳහා

**2.2.** ගුරු භවතුන් සඳහා

**2.3.** දෙමව්පියන් සඳහා

**3.** මොඩ්වුල සැලැස්ම

**3.1.** මාතෘකාව

**3.2.** අරමුණ

**3.3.** පාඩමට පිවිසීම

**3.4.** ක්‍රමවේදය

**3.5.** අවශ්‍ය සම්පත්

**3.6.** කාලය

**3.7.** ආවර්ජනය (සෑම සැසියකටම වැඩිහිටි සිසුවකු වාර්තාකරුවකු ලෙස පත්කර සැසිය අවසානයේ උගත් දේ පිළිබඳ කෙටි වාර්තාවක් ඉදිරිපත් කිරීම)

**අන්තර්ජාලය නිසි / අනිසි ලෙස භාවිතා කිරීමට අදාළ HateFreeCP එක් දින පාසල් වැඩසටහන**

**දෙමාපියන් සඳහා වන මොඩියුලය**

සැසි 1

**මාතෘකාව** - අන්තර්ජාලයේ වාසි සහ අවාසි

කාලය - මිනිත්තු 20-30 අතර

අවශ්‍ය සම්පත් - ලිවීම සඳහා කුඩා කොළ කැබලි

ක්‍රමවේදය - මේ සඳහා කුඩා කොළ කැබලි කපා ගෙන තිබේ නම් ප්‍රයෝජනවත් වේ. ඒවායේ ලියා ඉදිරිපත් කිරීමට සහභාගී වන්නන්ට උපදෙස් දිය හැක. ලැබෙන ප්‍රතිචාර නිසි හා අනිසි ලෙස තීරු දෙකක Flip chart එකක ලිවිය හැකි වේ . සහභාගි වවන්නන් ඉදිරිපත් නොකළ කරුණු උපදේශකයාට එකතු කිරීමට පුළුවන.ඉන්පසු ඒ ගැන සහභාගී වන්නන්ගෙන් අදහස් විමසමින් කෙටි සාකච්ඡාවක් කිරීම.

මේ සඳහා ඇමුණුම 1 හි ඇති කරුණු භාවිතා කිරීමට පුළුවන.

ආවර්ජනය - වාර්තා කරන්නා සැසිය අවසානයේ වාර්තාව ඉදිරිපත් කිරීම.

සැසි 2

**මාතෘකාව** - අන්තර්ජාලයෙන් සිසුන්ට ගත හැකි ප්‍රයෝජන හඳුන්වා දීම

කාලය - පැය 1 ක් පමණ

අවශ්‍ය සම්පත් - පාසලේ පහසුකම් තිබේ ටැබ් එකක් හෝ ලැප් එකක් හෝ ප්‍රොජෙක්ටරයක් භාවිතා කර අන්තර් අන්තර්ජාලය සිසුවකුට ප්‍රයෝජන වන ආකාරය දැක්වෙන උදාහරණ සිසුන්ට පෙන්වාදිය හැකි වේ. කෙසේ වුවද සහභාගිවන්නන්ට එම වැදගත් කරුණු ලියා ගැනීමට වේලාවක් දෙන්නේ නම් මැනවි. අත් පත්‍රිකාවක් කෙටියෙන් සාදා දීම ද සුදුසු වේ.

ක්‍රමවේදය - ඉහත දක්වන ලද දැනුම සහ කුසලතා ලබා ගැනීමට අන්තර්ජාලයේ පවතින පහසුකම් පෙන්වාදිය හැකි වේ

නිදසුන්

https://www.e-thaksalawa.moe.gov.lk/Si/index.php

https://www.khanacademy.org

voice typing,translation,dictionary

මෙහිදී ළමුන් විසින් අන්තර්ජාලය ප්‍රයෝජනයට ගෙන කර තිබෙන නිර්මාණ උදාහරණ ලෙස පෙන්වීම හෝ කියා දීම ද ඔවුන් නිසි මඟට යොමු කිරීමට පෙළඹවීමක් වනු නොඅනුමානය.

ආවර්ජනය - වාර්තා කරන්නා සැසිය අවසානයේ වාර්තාව ඉදිරිපත් කිරීම.

සැසි 3

**මාතෘකාව** - අන්තර්ජාලයෙන් බොහෝවිට ගන්නා අනිසි ප්‍රයෝජන

කාලය - පැය 1-1 ½ අතර

අවශ්‍ය සම්පත් - Flip chart , ලිවීමට අවශ්‍ය දේ

ක්‍රමවේදය - මුලින් උපදේශකයා විසින් කරන මූලික සාකච්ඡාව.ඉන්පසු කාණ්ඩ වැඩ සහ සාකච්ඡා.මෙහිදී කලින් අනිසි භාවිතයන් ගැන ලියන ලද Flip chart භාවිතයට ගන්න. අනිසි දෙයින් සිදුවන හානි දෙආකාරයකට බෙදිය හැකි බව පෙන්වා දිය යුතුයි.

1. සමාජයට සිදුවන හානි
2. තමාට සිදුවන හානි

මෙම දෙවර්ගයේ හානි සොයා බැලීමට කන්ඩායම් ක්‍රමය භාවිතා කළ හැකිවේ.කන්ඩායම් වලට බෙදා සමාජයට වන හානි සහ තමන්ට වන හානි පිළිබඳව තොරතුරු සොයා කණ්ඩායමේ කෙනෙකු විසින් ඉදිරිපත් කිරීම. කණ්ඩායම් ඉදිරිපත් කිරීම අවසානයේ උපදේශකයා ඒවා ගැන කතා කරමින් ඒවායේ නීතිමය තත්ත්වය , ආචාරධර්ම හා මානව අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරය ගැන සාකච්ඡා කිරීම. කණ්ඩායම් ඉදිරිපත් නොකළ දේ තිබේ නම් ඒවා ඉදිරිපත් කර සාකච්ඡාවට ගැනීම වැදගත් වේ.

මේ සඳහා ඇමුණුම 2 හි කරුණු අදාළ කරගත හැකිය.

ආවර්ජනය - වාර්තා කරන්නා සැසිය අවසානයේ වාර්තාව ඉදිරිපත් කිරීම.

සැසි 4

**මාතෘකාව** - අනිසි භාවිතය නිසා ඇතිවන ගැටලුවලට උපකාර විය හැකිය ආයතන

ක්‍රමවේදය - දෙවර්ගයටම සිදුවන හානි අතරට නීතියේ සහය පැතීම මෙන්ම සෞඛ්‍ය අංශවවල පිහිට පැතීමට (අන්තර්ජාල ක්‍රීඩා වලට ඇබ්බැහි වීම වැනි දෑ නිසා සිදුවන මානසික හා අක්ෂි ආබාධ ආදිය ) තිබෙන ආයතන ගැන දැනුවත් කිරීම්

ආවර්ජනය - වාර්තා කරන්නා සැසිය අවසානයේ වාර්තාව ඉදිරිපත් කිරීම.

සැසි 5

**මාතෘකාව** - පෙර පාසල්/ප්‍රාථමික පන්ති වල ළමුන්ට සුදුසු ක්‍රීඩා මගින් දැනුම සපයන ආකාර පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම

ක්‍රමවේදය - සැලකිලිමත් විය යුතු කරුණු සහ යොදා ගත හැකි වෙබ් අඩවි පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම

ළමා මිතුරු සෙවුම් යන්ත්‍ර භාවිතය(Kiddle or Kidtopia)

ළමුන්ට ගැලපෙන මාතෘකා සහ ඉගෙනුම් ද්‍රව්‍ය සහිත වෙබ් අඩවි (ABC Kids, CBeebies, YouTube Kids or KIDOZ)

දරුවා සමඟ ගතකරන කාලය සම්බන්ධව family media plan සෑදීම.

නිදසුන - පවුලේ සියළු දෙනාම අනුගමනය කළ යුතුයි(no mobiles phone at mealtimes)